# විෂය නිර්දේශය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කරගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි. | 1.1 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුද්ද මගින් ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටු කරගනියි.<br><br>1.2 දේශන සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද මගින් විචාරාක්ෂියෙන් යුතු ව භාෂාව හසුරුවයි.<br><br>1.3 විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි.<br><br>1.4 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි. | ප්‍රවීණ නාට්‍ය පිටපත් රචකයකුගේ ගුවන්විදුලි හෝ රූපවාහිනී නාට්‍ය පිටපතක්<br><br>සාහිත්‍ය කෘතියක් හෝ සාහිත්‍යධරයෙකු පිළිබඳ ව කෙරෙන දේශනයකට හෝ සංවාදයකට සවන් දීම<br>ගුත්තිල කාව්‍යය<br>සාගර පලන්සූරිය මහතා<br>පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සව, ක්‍රීඩා තරග, කලා උලෙළ ආදි සුවිශේෂ අවස්ථාවල කෙරෙන විස්තර ප්‍රකාශවලට සවන් දීම.<br><br>ටීකා සිව්පද, විරිදු පන්තියක් |
| 2.0 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි. | 2.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.<br><br>2.2 තර්කානුකූල ව විචාරශීලී ව හා නිවැරදි ව බස හසුරුවමින් කතා කරයි. | වියත් කථිකයකු විසින් කරන ලද කතාවක්<br><br>විවාද<br>සාකච්ඡා |
| 3.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 3.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්දනගා කියවයි.<br><br>3.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br><br>3.3 විවිධ ශෛලිවලට අනුව කියවීමේ හුරුව ලබයි.<br><br>3.4 පොතපත කියවීමෙන් ස්මරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි. | නිවැරදි උච්චාරණය<br>හඬ පාලනය<br>කියවීමේ වේගය පාලනය<br>පද වෙන් කිරීම<br>(විද්‍යා ප්‍රබන්ධයක්)<br><br>භාෂාව පිළිබඳ ලියවුණු ශාස්ත්‍රීය ලිපියක්<br><br>සද්ධර්මාලංකාරය කෘතියෙන් උපුටා ගත් කතාවක්<br><br>දේශීය ජන කතාවක් හෝ ශාස්ත්‍රීය ලිපියක්<br>කතා සාරය ගොඩනැගීම<br>වැදගත් කරුණු සටහන් කර ගැනීම |
| 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 තර්කානුකූල ව අදහස් ඉදිරිපත් කරමින් උචිත ලෙස කරුණු සංවිධානය කරගනිමින් ලියයි.<br><br>4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | මාතෘකානුකූල ව රචනා ලිවීම<br><br>විරාම ලකුණු (වරහන්, කාකපාදය, තිත්පෙළ, කුණ්ඩලිය)<br>පද බෙදීම |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | | නාමපද, ක්‍රියාපද, නිපාත පද වෙන් කොට ලිවීම.<br>සංඛ්‍යා හා බැඳුණු අකුරු එක්කොට ලිවීම. නිද. 12ක්, 23කට<br>ද නිපාත වෙන් කොට ලිවිය යුතුයි. නිද. අම්ම යි, තාත්ත යි |
| 5.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාං මාලාව පෝෂණය කරගෙන භාෂා කාර්යන්හිදී උචිත පරිදි භාවිතයට ගනියි. | 5.1 භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස සාම්ප්‍රදායික යෙදුම් යොද ගනියි.<br><br>5.2 විවිධ භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුවත්භාවයෙන් යුතු ව සන්නිවේදනයේ යෙදෙයි. | ප්‍රස්තාව පිරුළු<br>ආප්තෝපදේශ<br><br>ප්‍රදේශීය භාෂා ව්‍යවහාර ඇතුළත් සාහිත්‍ය නිර්මාණයක් |
| 6.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත්කරණය සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 6.1 නිවැරදි ව හා නිර්මාණශීලී ව ආරාධනා පත්‍ර හා සුබ පැතුම්පත් සකස් කරයි.<br><br>6.2 ආකෘති පත්‍ර පිරවීමේ හා සකස් කිරීමේ පරිචය ලබයි.<br><br>6.3 තොරතුරු ප්‍රකාශ කිරීම සඳහා පුවත්පත් වාර්තා සකස් කරයි. | ආරාධනා පත්‍ර<br>සුබ පැතුම්පත්<br><br>ආකෘති පත්‍ර පිරවීම<br>විදුලි පණිවිඩ, මුදල් ඇණවුම්, බැංකු ගනුදෙනු ආදිය<br>පුවත්පත් වාර්තා<br>(පාසල් ක්‍රීඩා උත්සවය, ත්‍යාග ප්‍රදානෝත්සවය ආදි අවස්ථා අළලා ලියන ලද පුවත්පත් වාර්තා) |
| 7.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහාගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් ලියයි. | 7.1 ශ,ෂ,ස අකුරු සහිත වචන නිවැරදි ව ලියයි. | ශ, ෂ, ස භාවිතය පිළිබඳ සම්මත රීති |
| 8.0 ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කර ගනියි. | 8.1 ක්‍රියාපද සැකසීම හා භාවිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.<br><br>8.2 ලේඛනයේ දී නිවැරදි ව විශේෂණ පද යොදා ගනියි.<br><br>8.3 නිපාත පද හා උපසර්ග නිවැරදි ව වාක්‍යවල යොදයි.<br><br>8.4 සම්මත රීතිවලට අනුව වාක්‍ය ලියයි. | අසම්භාව්‍ය ක්‍රියාපද<br><br>විශේෂණ පද<br>නාම විශේෂණ පද<br>ක්‍රියා විශේෂණ පද<br>නිපාත පද<br>උපසර්ග<br><br>වාක්‍ය රීති<br>අප්‍රාණවාචී බහුවචන උක්තය සහිත වාක්‍ය<br>ඕ, හු බහුවචන ප්‍රත්‍යය යෙදෙන වාක්‍ය<br>ගෞරවාර්ථය හඟවන උක්තය සහිත වාක්‍ය<br>නිත්‍ය බහුවචන උක්තය සහිත වාක්‍ය |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 9.0 භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගාගැනීම සඳහා ක්‍රියා කරයි. | 9.1 සංස්කෘතික හා හර පද්ධතින් අගය කරමින් කියවයි.<br><br>9.2 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි. | දේශීය වී ගොවිතැන හා බැඳුණු අපේ සංස්කෘතිය<br><br>දේශාභිමානී ගීත<br>පන්සලේ පල්ලියේ.......<br><br>(රචනය පූජ්‍ය රඹුක්කන සිද්ධාර්ථ හිමි) |
| 10.0 නව සාහිත්‍යික, දර්ශනික, විද්‍යාත්මක සහ තාක්ෂණික වටිනාකමින් යුත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදාගනියි. | 10.1 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල කැපී පෙනෙන භාෂා රටා, සම්ප්‍රදාය හා සුවිශේෂතා හඳුනාගෙන විස්තර කරයි.<br><br>10.2 විවිධ දර්ශනිකයන්ගේ චරිත හා ඉගැන්වීම් පිළිබඳ ලිපි ලේඛන කියවයි.<br><br>10.3 විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත කියවා ලබා ගත් කරුණු භාෂා කාර්යයන් සඳහා යොද ගනියි. | නූතන සාහිත්‍යවේදීන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ ලියවුණු ලිපි.<br>මහාචාර්ය සුනිල් ආරියරත්න, රත්බණ්ඩා සෙනෙවිරත්න, ලූෂන් බුලත්සිංහල, රත්න ශ්‍රී විජේසිංහ විවිධ දර්ශනිකයන්ගේ මත හා අදහස් ඇතුළත් රසවත් නිර්මාණයක්<br>මහත්මා ගාන්ධි<br><br>විද්‍යාව හා තාක්ෂණය ගැන ලියැවුණු සාහිත්‍ය නිර්මාණයක්. |
| 11.0 රසඥතා වර්ධනය උදෙසා සාහිත්‍ය නිර්මාණය පරිශීලනය කරයි. | 11.1 ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා රස විඳියි. | කෙටි කතාවක්,<br>සන්දේශ කාව්‍යයකින් උපුටා ගත් කවි,<br>තහංචි කවි |
| 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.<br><br>12.2නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.<br><br>12.3 කෙටි නාට්‍ය පිටපත් රචනා කරයි. | කවි රචනා කිරීම<br>නූතන කවි පන්තියක්<br>නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනා කිරීම<br><br>ළමා නාට්‍ය පිටපත් |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.